චක්‍රලේඛ අංකඃ- ...15/...2014

මගේ අංකඃඩබ්/සි.පසු.ව්‍ය/2014
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09,
2014.05.09.

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**මහින්ද චින්තන ඉදිරිදැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ සිරකරු පවුල් සුභසාධනය,සංවර්ධනය හා පසුභාරකාරිත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

සිරකරු පුනරුත්ථාපනය වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මහින්ද චින්තන ඉදිරිදැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දීප ව්‍යාප්ත යාන්ත්‍රනයක් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල කේන්ද්‍රකරගෙන ආරම්භ කර ඇත

මෙම නව යාන්ත්‍රනය තුලින් සිරකරු පුනරුත්ථාපනය, සිරකරු පවුල් සුභසාධනය හා පසුභාරකාරිත්ව වැඩසටහන් වල ගුණාත්මක සංවර්ධනයක් අපේක්ෂා කෙරේ.මේ සඳහා දැනටමත් උපාධිධාරී සංවර්ධන නිලධාරින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අමාත්‍යංශය විසින් අනුයුක්ත කෙරෙමින් පවතී.

එකී සංවර්ධන නිලධාරින්ගේ මූලික රාජකාරි වගකීමක් වන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය වශයෙන් පවතින භෞතික හා මානව සම්පත් හඳුනාගෙන එම සම්පත් ප්‍රයෝජනයට ගනිමින් මෙම යාන්ත්‍රනය අර්තවත් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමත් ඒ තුලින් සිරගතවන්නන් යහපත් පුරවැසියන් පිරිසක් ලෙස සමාජගත කිරීමටත්, බන්ධනාගාර ගතවීම අවම කිරීමටත්, මොවුන් ජාතික සංවර්ධනයට දායකකර ගැනීමටත් අපේක්ෂා කෙරේ.මෙලෙස ස්ථාපිත කෙරෙන නව යාන්ත්‍රනය අර්ථවත් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලයින් බන්ධනාගාරගත වීමේදී හා නිදහස් වීමේදී ඔවුන් හා ඔවුන්ගේ දරුපවුල් සම්බන්ධ තොරතුරු එකී නිලධාරින්ට ලබාදිය යුතුව ඇත.

ඒ සඳහා දැනටමත් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන පවුල් සුභසාධනය හා පසුභාරකාරිත්ව වැඩසටහන යටතේ සම්පූර්ණ කර ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත යැවෙන සිරකරුවන්ට අදාල පෝරම සම්බන්ධයෙන් මින් ඉදිරියට පහත සඳහන් පරිදි ක්‍රියාකරන ලෙසට ඔබගේ පුනරුත්ථාපන නිලධාරින්ට උපදෙස් දෙන ලෙස දන්වමි.

01.සිරකරු බන්ධනාගාරගතවූ විගස පුනරුත්ථාපන නිලධාරින් විසින් සිදුකරන ආරම්භක හැඳින්වීමේ වැඩසටහන් ප්‍රයෝජනයට ගනිමින් ඔවුන්ගේ පවුල් සහසාධනයට අවශ්‍ය වන පෝරම සම්පූර්ණ කර පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරන අමාත්‍යංශයට **Email** කර පිටපතක් බන්ධනාගාර කොමසාරිස්(පුනරුත්ථාපන) වෙත සැපයීමට කටයුතු කලයුතුය.

02.සිරකරු නිදහස්වීමට මාස තුනකට පෙර සම්පූර්ණ කෙරෙන පසුභාරකාරිත්ව පෝරම ඉහතකී පරිදිම පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයට **Email** කර පිටපතක් බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත සැපයීමට කටයුතු කරන ලෙසටත් උපදෙස් දෙන අතර, අමාත්‍යංශය විසින් අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අවශ්‍ය පරිදි තොරතුරු සපයනු ඇත

03.මහින්ද චින්තන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරෙන මෙම නව මෙහෙයුම් යාන්ත්‍රනය සාර්ථක කරගැනීමට අවශ්‍යවන ඉහත තොරතුරු අඛණ්ඩව සැපයීම රාජකාරි වගකීමකිමකින් යුතුව ඉටුකිරීමට පුනරුත්ථාපන නිලධාරින් වගබලාගත යුතුය. එසේ කටයුතු නොකරන පුනරුත්ථාපන නිලධාරින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන බවද දන්වමි.

04.මේ සම්බන්ධයෙන් ඔබගේද පෞද්ගලික අවධානය යොමුකරන මෙන් වැඩිදුරටත් දන්වමි.
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ **Email** ලිපිනය **mrprderelopment@yahoo-com**

සැ.යු - මෙම චක්‍රලේඛය ඔබ වෙත ලැබුණ බව දන්වා එවිය යුතුයි.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

01.ලේකම්:-
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය. - කා.දැ.ගැ.පි.

02.අතිරේක ලේකම්(සංවර්ධන):-
පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශය - කා.දැ.ගැ.පි